සෙලාන් ඉතුරුම් සැලසුම් (ශ්‍රී.ලං.රු./ඇ.ඩො) /සෙලාන් ළමා ඉතුරුම් සැලසුම් සඳහා වන නීතිරීති හා කොන්දේසි

කොළඹ 03, ගාලු පාර, අංක 90 දරන ස්ථානයේ පිහිටි සෙලාන් ටවර් හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PQ 9 දරන) **සෙලාන් බැන්ක් පී.එල්.සී** (මෙහි මින්මතුවට "**බැංකුව**" යනුවෙනු හැඳින්වෙනු ඇත) හි විවෘත කර පවත්වාගෙන යනු **ලබන සෙලාන් ඉතුරුම් සැලසුම්/ සෙලාන් ළමා ඉතුරුම් සැලසුම්** ගිණුම් සඳහා වන නීතිරීති හා කොන්දේසි (මින් මතුවට මෙහි "**SSP** හෝ **SKSP** ගිණුම්" යනුවෙන් හැඳින්වෙනු ඇත.) පහත පරිදි වේ;

<u>ගිණුම විවෘත කිරීම</u>

1. ගිණුම් විවෘත කිරීමේ ලේඛන සම්පූර්ණ කිරීමෙන් පසුව සහ එයට බැංකුවේ අනුමැතිය ලැබීමෙන් පසුව, ගිණුම විවෘත කරන අවස්ථාවේ දී වයස අවුරුදු 18ට වැඩි වන ඕනෑම තැනැත්තෙකු හෝ තැනැත්තන් (මින් මතුවට මෙහි තනිව සහ /හෝ සාමූහිකව "ගනුදෙනුකරු" ලෙස හැඳින්වෙනු ඇත) විසින් **SSP / SKSP** ගිණුම් විවෘත කළ හැකිය.

2. කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරු මියගියහොත්, **SKSP** ගනුදෙනුකරු විසින් එම **SKSP** ගිණුමෙහි ශේෂයේ ප්‍රතිලාභියා ලෙස බාලවයස්කරුවෙකු (මින් මතුවට මෙහි "බාලවයස්කරු" ලෙස හැඳින්වෙනු ඇත) ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේටයේ නම් කළ යුතු වේ. අවශ්‍ය අනිවාර්ය ලේඛන වලට අමතරව, ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී පරීක්ෂා කර බැලීම සඳහා බාලවයස්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු අතර. එහි පිටපතක් බැංකුවේ වාර්තා සඳහා ලබාගැනීමෙන් පසුව මුල්පිටපත ආපසු ලබාදෙනු ඇත.

කල්පිරීමේ ඉලක්ක මුදල සහ කල්පිරීමේ දිනය

3. රු. 100,000/-ක අවම කල්පිරීමේ ඉලක්ක මුදලක් සහ රු. 10,000,000/-ක උපරිම කල්පිරීමේ ඉලක්ක මුදලක් සහිතව **SSP / SKSP** ගිණුම් ආරම්භ කළ හැකිය. කල්පිරීමේ ඉලක්ක මුදල ඇමෙරිකානු ඩොලර් (USD) වලින් ඩොලර් 1,000/- සිට ඩොලර් 50,000/- දක්වා වනු ඇති අතර එසේ භාරගනු ලබන්නේ **SSP** ගිණුම් සඳහා පමණි. "කල්පිරීමේ ඉලක්ක මුදල" (මින් මතුවට මෙහි "**MTA**" යනුවෙන් හැඳින්වෙනු ඇත) යන්නෙන් අදහස් වන්නේ, බැංකුවේ නීතිරීති සහ කොන්දේසි වලට යටත්ව, **සෙලාන් ඉතුරුම් සැලසුම්/ සෙලාන් ළමා ඉතුරුම් සැලසුම්** ගිණුම් (මින් මතුවට මෙහි "ඉතුරුම් සැලසුම" යනුවෙන් හැඳින්වෙනු ඇත) යටතේ කල්පිරීමේ දිනයේ දී ලබාගැනීමට ගනුදෙනුකරු බැංකුව සමග ගිවිස ගන්නා මුදල වේ.

4. **SSP** ගනුදෙනුකරුවන්ට වසර 2ක අවම කාලසීමාවක් තුළ සහ උපරිම වශයෙන් වසර 5ක කාලසීමාවක් තුළ හෝ, බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙනත් කාලසීමාවක් තුළ කල්පිරීමේ ඉලක්ක මුදල ළඟා කරගැනීමට තෝරාගත හැකිය.

5. කල්පිරීමේ දිනයට බාලවයස්කරු වයස අවුරුදු 18 සම්පූර්ණ කර නොමැති වන්නේ නම්, **SKSP** ගනුදෙනුකරුවන්ට වසර 3ක අවම කාලසීමාවක් තුළ සහ උපරිම වශයෙන් වසර 18ක කාලසීමාවක් තුළ කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA**) ළඟා කරගැනීමට තෝරාගත හැකිය. "කල්පිරීමේ දිනය" යන්නෙන් අදහස් වන්නේ, බැංකුවේ නීතිරීති හා කොන්දේසි වලට යටත්ව, අදාළ ඉතුරුම් ගිණුම යටතේ කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA**) ලබාගැනීමට ගනුදෙනුකරු බැංකුව සමග ගිවිසගෙන සහ තෝරාගෙන ඇති දිනය වේ.

6. **SSP** / **SKSP** ගිණුමක් විවෘත කරන අවස්ථාවේ දී, ඉහත 3 වන වගන්තියට යටත්ව, ගනුදෙනුකරු විසින් කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA)** තෝරගත යුතු අතර, කල් පිරීමේ දිනයේ දී ඔහු කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA)** ඉතුරුම් සැලසුම යටතේ ලබා ගැනීමට කැමති නම්, ඒ බව ගිණුම විවෘත කිරීමේ පෝරමයෙහි දක්වා තිබිය යුතු වේ. කල් පිරීමේ දිනයේ දී කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA)** ලබා ගැනීම සඳහා ගිණුම වෙත තැන්පත් කළ යුතු මාසික වාරිකය සහ එය ගෙවීමට නියමිත දිනය ගිණුම විවෘත කරන අවස්ථාවේ දී, බැංකුව විසින් ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ඇත.

වාරික

7. බැංකුව විසින් දැනුම් දී ඇති පරිදි නියමිත දිනට හෝ ඊට පෙර **SSP / SKSP** ගිණුම වෙත නියමිත මාසික වාරිකය තැන්පත් කිරීමට ගනුදෙනුකරු භාරගෙන එකඟ වේ. ආරම්භක/පළමු වාරිකය ලෙස, සෘජු මුදල් තැන්පතු හෝ මුදල් පැවරුම් පිළිගැනෙනු ඇත. ඉන් පසුව ගෙවනු ලබන වාරික ස්ථාවර ගෙවීම් ලෙස පමණක් ගෙවනු ලැබිය යුතු අතර, ඉතුරුම් සැලසුම් ගිණුමට සෘජු මුදල් තැන්පතු හෝ මුදල් පැවරුම් සඳහා අවසර නොලැබෙනු ඇත. **SSP / SKSP** ගිණුම් වල කල්පිරීමේ දිනය තෙක් සෑම මාසයකම නියමිත දින හෝ ඊට පෙර, ගෙවිය යුතු සම්පූර්ණ මුදල සඳහා මාසික ස්ථාවර නියෝග ගෙවීම් සිදුකිරීම, ගනුදෙනුකරු තෝරාගෙන ඇති කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA)** ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අනිවාර්ය අවශ්‍යතාවක් වේ. ඉහත කී පරිදි කල්පිරීමේ දිනය තෙක් සෑම මාසයකම නියමිත දින හෝ ඊට පෙර, ගෙවිය යුතු සම්පූර්ණ මුදල සඳහා වාරික මුදල් මාසික ස්ථාවර නියෝග මගින් ගෙවීම් සිදුකිරීමට අපොහොසත් වීම හේතුවෙන්, කලින් තීරණය කර ඇති පොලී අනුපාතයට කල්පිරීමේ දිනයේ දී කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA)** ලබාගැනීමට ගනුදෙනුකරු හිමිකම් නොලබනු ඇත.

කල්පිරීමේ දී පොලිය සහ ගෙවීම් සිදු කිරීම

8. ගිණුම් වල පවතින දෛනික ශේෂය මත බැංකුව විසින් නියම කර ඇති අනුපාතයට පොලිය ගණනය කර, කල්පිරීමේ දිනය දක්වා මාසික පදනමින් අදාළ ගිණුම් වලට බැර කෙරෙනු ඇත.

9. ගනුදෙනුකරු විසින් සෑම අවස්ථාවකදී ම මෙම සියලුම නීතිරීති හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කර තිබීමට යටත්ව, කල්පිරීමේ දිනයේ දී හෝ ආයෝජන කාලසීමාව තුළ නීතියෙන් නියම කර ඇති පරිදි ගෙවිය යුතු වන බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත අයකිරීම් අඩුකිරීමෙන් පසුව, කල්පිරීමේ දිනයේ දී බැංකුව විසින් කල්පිරීමේ ඉලක්ක මුදල (**MTA**) ගනුදෙනුකරු වෙත ගෙවනු ඇත.

10. බැංකුව විසින් නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරනු ඇති අතර, ගනුදෙනුකරු විසින් නීතියෙන් නියම කර ඇති පරිදි ගිණුම් විවෘත කිරීමේ ලේඛන සහ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයන් සම්පූර්ණ නොකරන්නේ නම්, ඒ මත ගෙවිය යුතු වන සියලු ගෙවීම් ගනුදෙනුකරුගේ ගිණුමෙන් හර කර අදාළ රජයේ අධිකාරීන් වෙත ගෙවනු ඇත.

11. ගනුදෙනුකරු විසින් අවශ්‍ය මාසික වාරික මුදලට අතිරේකව යම් මුදලක් තැන්පත් කරන්නේ නම්, එවිට, එසේ තැන්පත් කළ එකී අතිරේක මුදල මත පොලියක් හෝ යම් අතිරේක පොලී අනුපාතයක් හෝ ගෙවීමට බැංකුව බැඳී නොසිටිනු ඇති අතර, බැංකුව විසින් ස්වකීය පූර්ණ අභිමතය පරිදි එකී මාසික වාරික මුදලට අතිරේකව තැන්පත් කරන ලද අතිරේක මුදල මත ගෙවිය යුතු පොලී අනුපාතය තීරණය කරනු ඇත.

කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරුගේ මරණය සිදුවීම

12. කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරුගේ මරණය සිදුවුවහොත් එවිට, SKSP ගිණුම අවසන් වනු ඇති අතර, එවිට බාලවයස්කරුගේ නමින් සෙලාන් ටිකිරි/සෙලාන් බාලවයස්කාර ගිණුමක් (බාලවයස්කාර ගිණුම) විවෘත කිරීමට සහ ගනුදෙනුකරුගේ මරණය සිදු වූ දිනය වනවිට ආයෝජනය කළ මූලික මුදල සහ සාමාන්‍ය පරිදි එකතු වී ඇති සියලුම පොලිය ද ඇතුළත්ව ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත අයකිරීම් අඩුකර, SKSP ගිණුමෙහි ඇති ශේෂය එම බාලවයස්කාර ගිණුමට මාරු කර, එහි තැන්පත් කිරීමට ගනුදෙනුකරු මෙමගින් එකඟ වී බැංකුවට අවසර ලබා දෙයි. කල්පිරීමේ දිනයට පෙර **SSP** ගිණුමක ගනුදෙනුකරු මියගියහොත් **SSP** ගිණුම අවසන් වනු ඇති අතර මරණය සිදු වූ දින වනවිට පවතින අදාළ නීතිරීති වලට අනුව, ඉතුරුම් සැලසුම යටතේ ආයෝජනය කර ඇති මූලික මුදල සහ එකතු වී ඇති සාමාන්‍ය ඉතුරුම් ගිණුමට අදාළ සියලුම පොලී මුදල් ද ඇතුළත්ව, ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත ගෙවීම් අඩු කර **SSP** ගිණුමෙහි ශේෂය ගෙවනු ලැබේ.

13. සෙලාන් ටිකිරි/ සෙලාන් බාලවයස්කාර ගිණුම කලින් කලට සංශෝධනය කර ඇති ආකාරයට එම සෙලාන් ටිකිරි/ සෙලාන් බාලවයස්කාර ගිණුම් වලට අදාළ නීතිරීති හා කොන්දේසි මගින් පාලනය වනු ඇත.

14. බාලවයස්කරු ගනුදෙනුකරුට පෙර මියගියහොත්, මරණය සිදුවූ දින වනවිට පවතින නීතිරීති වලට අනුව, ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත ගෙවීම් අඩු කර **SKSP** ගිණුමෙහි ශේෂය ගනුදෙනුකරුගේ උරුමකරුවන් පොල්මඃකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් වෙත ගෙවනු ලැබේ.

ගිණුම අවසන් කිරීම

15. ගනුදෙනුකරු අඛණ්ඩව මාස දෙක (02)ක් ස්ථාවර නියෝග පැහැර හරින අවස්ථාවක දී බැංකුව ඉතුරුම් සැලැස්ම අවසන් කර **SSP / SKSP** ගිණුම වසා දැමිය යුතුය. මෙම වගන්තියේ සඳහන් පරිදි කල් පිරීමේ දිනයට පෙර ඉතුරුම් සැලැස්ම අවසන් කළහොත්, නියමයන් සහ කොන්දේසිවල යටත්ව,

    a) ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු ඕනෑම අදාල බදු, ව්‍යාස්ථාපිත බදු සහ ගිණුම් වැසීමේ ගාස්තු අඩු කිරීමෙන් පසු, එම අවසන් කිරීමේ දිනය දක්වා සාමාන්‍ය ඉතුරුම් අනුපාතයට ගැලපූ උපචිත පොලිය සමග අයෝජනය කළ මුළු මුදල බැංකුව ගනුදෙනුකරුගේ ඉතුරුම්/ජංගම ගිණුමට බැර කළ යුතුය.

    b) එකඟ වූ කාල සීමාව තුළ ස්ථාවර නියෝග ගෙවීම් දෙකකට වසා **SSP / SKSP** ගිණුම වෙත ගෙවීමට ගනුදෙනුකරු අපොහොසත් වුවහොත්, ගනුදෙනුකරු එකඟ වූ පොලී අනුපාතයට හිමිකම් නොලබන අතර, ඒ වෙනුවට පොලිය සාමාන්‍ය ඉතුරුම් අනුපාතයට බදු, ව්‍යවස්ථාපිත බදු සහ ගිණුම් වැසීමේ ගාස්තු යටතේ සකස් කරනු ලැබේ.

16. සුවිශේෂී හේතුවක් මත හැරෙන්නට, කල්පිරීමේ දිනයට පෙර **SSP / SKSP** ගිණුම වසා දමා එහි ශේෂය ඉවත් කර ගැනීමට ගනුදෙනුකරුට අවසර නොලැබෙනු ඇති අතර, එය සම්පූර්ණයෙන්ම බැංකුවේ පූර්ණ අභිමතය පරිදි සිදු වනු ඇත. කල්පිරීමේ දිනයට පෙර **SSP / SKSP** ගිණුම වසා දැමීමට බැංකුව විසින් ගනුදෙනුකරුට අවසර ලබා දෙන අවස්ථාවක, බැංකුවේ නීතිරීති හා කොන්දේසි වලට යටත්ව බැංකුව විසින් එසේ අවසන් කරනු ලබන කාලය දක්වා එකතු වී ඇති ආයෝජනය කළ මූලික මුදල සහ එකතු වී ඇති සාමාන්‍ය ඉතිරි කිරීමේ පොලිය, ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත අයකිරීම් සහ ගිණුම වසාදැමීමේ ගාස්තු අඩු කර, ගනුදෙනුකරු වෙත ගෙවනු ඇත.

17. ඉහත 15 හෝ 16 වන වගන්ති යටතේ දක්වා ඇති කිසියම් තත්ත්වයක් යටතේ ගනුදෙනුකරු විසින් හෝ බැංකුව විසින් යම් ඉතුරුම් සැලසුමක් අවසන් කරනු ලබන සහ යම් **SSP / SKSP** ගිණුමක් වසා දමන අවස්ථාවක බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි ඉතුරුම් සැලසුමට අදාළව ප්‍රතිලාභ සහ සේවාවන් සැපයීමේ දී බැංකුව විසින් දරා ඇති පිරිවැය ඇත්නම්, අයකර ගැනීමට කටයුතු කරනු ඇති අතර, **SSP / SKSP** ගිණුමෙහි ආයෝජනය කර ඇති මූලික මුදල මත බැංකුවේ පූර්ණ අභිමතය පරිදි තීරණය කරනු ලබන සාමාන්‍ය ඉතුරුම් ගිණුමට අදාළ පොලී අනුපාතය යටතේ පොලී ගෙවීමට ද බැංකුවට හිමිකම් පවතිනු ඇත.

සාමාන්‍ය කොන්දේසි

18. ගනුදෙනුකරු විසින් තෝරා ගෙන ඇති ඉතුරුම් සැලසුම පිළිබඳ විස්තර දැක්වෙන ආයෝජනය පිළිබඳ දැනුම්දීමක්, ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ගනුදෙනුකරු වෙත නිකුත් කෙරෙනු ඇත. ගනුදෙනුකරු වෙත කිසිදු පාස්පොතක් නිකුත් නොකෙරෙනු ඇත.

19. බැංකුව විසින් ගනුදෙනුකරු වෙත කාර්තුමය ගිණුම් ප්‍රකාශනයක් ලබාදෙනු ඇත. කෙසේ වුවද, ගනුදෙනුකරු වෙත ගිණුම් ප්‍රකාශන ලබා දෙනු ලබන කාලාන්තරය වෙනස් කිරීමට බැංකුව අයිතිය රඳවා ගනු ඇත.

20. ගිණුම් ප්‍රකාශනය නිකුත් කරනු ලබන දිනයේ සිට දින 15ක් තුළ (මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31) ගිණුම් ප්‍රකාශනය නොලැබුණේ නම්, ඒ සම්බන්ධයෙන් බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. සටහන් කිරීම් වල නිවැරදි භාවය තහවුරු කර ගැනීම සඳහා, බැංකුව වෙතින් ලැබෙන සෑම ගිණුම් ප්‍රකාශනයක් ම පරීක්ෂා කර බැලීමට ගනුදෙනුකරු එකඟ වේ. යම් වරදක් ඇතොත්, ප්‍රකාශනය ලැබීමෙන් දින 21ක් තුළ ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

21. ගනුදෙනුකරු ඔහුගේ/ඇයගේ ගිණුම් ප්‍රකාශනයේ පිටපත් ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. බැංකුව පළ කර ඇති ගාස්තු ලැයිස්තුවට අනුකූලව මෙම සේවාව සැපයීම සඳහා ගාස්තු අය කිරීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

22. ගනුදෙනුකරුගේ ලිපිනයෙහි යම් වෙනස්වීමක් සිදුවුවහොත් වහාම ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

23. **SSP / SKSP** ගිණුම් යටතේ ගනුදෙනුකරුට පවතින අයිතීන් හෝ වගකීම් කිසිවක් බැංකුව විසින් වෙනත් අයෙකුට වෙන් කිරීම, පැවරීම, හෝ උකස් තැබීම සිදු නොකළ යුතු අතර, එවැනි ගනුදෙනුවක් මගින් ඍජුව හෝ වක්‍ර ලෙස සිදු වන යම් පාඩුවක් සඳහා බැංකුව බැඳී නොසිටින අතර, ඊට වග කියනු නොලැබේ.

24. මෙහි ඊට පටහැනිව කුමක් සඳහන් වුවද, බැංකුව විසින් ගනුදෙනුකරු වෙත දැනුම්දීමකින් තොරව, ගනුදෙනුකරුගේ **SSP / SKSP** ගිණුම් ගනුදෙනුකරුගේ වෙනත් යම් ගිණුමක් සමග හෝ ගනුදෙනුකරුට බැංකුව වෙත පවතින යම් වගකීමක් සමග ඒකාබද්ධ කිරීමට සහ **SSP / SKSP** ගිණුමෙහි බැරට පවතින යම් මුදලක් වෙනත් යම් ගිණුමක් යටතේ හෝ වෙනත් යම් ආකාරයකින් ගනුදෙනුකරු වෙතින් බැංකුවට ලැබිය යුතුව ඇති වෙනත් යම් මුදලක්, එම වගකීම් සත්‍ය හෝ අහඹු, මූලික හෝ ආනුෂංගික, සහ ඒකාබද්ධව හෝ වෙන් වෙන් ව පවතින ඒවා වුවද, පියවීමට හෝ මාරු කිරීමට හෝ හැකිය. බැංකුව වෙත ලැබිය යුතුව ඇති යම් මුදලක් පියවා ගැනීම සඳහා, බැංකුව විසින් සිදුකරනු ඇති එවැනි යම් පියවීමක් සිදු කිරීමට ගනුදෙනුකරු මෙමගින් ප්‍රකාශිතව අවසර ලබා දෙයි.

25. මෙම නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ එකතු කිරීමට ඕනෑම අවස්ථාවක බැංකුව සතු අයිතිය රඳවා තබා ගන්නා අතර, එවැනි ඕනෑම වෙනස් කිරීමක්, සංශෝධනයක් හෝ එකතු කිරීමක් පාරිභෝගිකයා මත බැඳී පවතී. එවැනි වෙනස් කිරීම්, සංශෝධනය කිරීම් හෝ එකතු කිරීම් පිළිබඳ දැන්වීම් වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරේ. වෙබ් අඩවියේ පෙන්වා ඇති දැන්වීම ප්‍රමාණවත් හා නිසි දැන්වීමක් ලෙස සලකනු ලබන අතර, එය පාරිභෝගිකයා වන බැඳී පවතී.

26. නීතිය මගින්, රජයේ රෙගුලාසියක් මගින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයක් පරිදි යම් සංශෝධනයක් අවශ්‍ය කෙරෙන අවස්ථාවක දී මෙම නීතිරීති හා කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වී පවතිනු ඇත.

27. මෙහි දක්වා ඇති සියලුම නීතිරීති හා කොන්දේසි මගින් ගනුදෙනුකරු බැඳී සිටිනු ඇති අතර, මෙහි දක්වා ඇති නීතිරීති හා කොන්දේසි වලට අමතරව, යම් ගිණුමක් විවෘත කිරීමට පෙර සියලුම ගනුදෙනුකරුවන් වෙත ලබා දෙනු ලබන පොදු ගිණුම් විවෘත කිරීමේ නීතිරීති හා කොන්දේසි වලට ද ගිණුම යටත් වනු ඇති අතර එමගින් ද බැඳී සිටිනු ඇත. මෙහි දැක්වෙන නීතිරීති හා කොන්දේසි කිසිවක් එකී පොදු ගිණුම් විවෘත කිරීමේ නීතිරීති හා කොන්දේසි වල අන්තර්ගත කරනු ලැබ තිබුණ ද නොතිබුණ ද ඒ බව නොතකා, මෙහි දක්වා ඇති සියලුම නීතිරීති හා කොන්දේසි මගින් ගනුදෙනුකරු සම්පූර්ණයෙන්ම සහ සමානව බැඳී සිටිනු ඇත.

28. පවතින රඳවා ගැනීමේ බදු නීති වලට ගිණුම් හිමියා යටත් නොවන්නේ නම්, එවිට එම ගිණුම් හිමියන් කල්පිරීමේ කාලසීමාවේ දී එකඟ වූ ඉලක්ක ගත මුදල ලැබීමට සුදුසුකම් ලබනු ඇත. ගිණුම් හිමියා පවතින රඳවා ගැනීමේ බදු නීති වලට යටත් වන්නේ නම්, මාසික වාරිකය රඳවා ගැනීමේ බදු අඩු කිරීම් වලට යටත් වනු ඇති අතර, කල්පිරීමේ දී අවසන් ඉලක්ක ගත මුදල එම අඩු කිරීම් වලට යටත් වනු ඇත.

29. හවුල් ගිණුමක් පවතින අවස්ථාවක, සහතිකයෙහි මූලික ගිණුම් හිමියාගේ සහ පළමු හවුල් ගිණුම් හිමියාගේ නම පමණක් අන්තර්ගත වනු ඇත.

30. හවුල් ගිණුම් හිමියන් විසින් මෙහි සඳහන් කර ඇති කාර්යයන් සඳහා මුදල් හර කිරීමට, ඔවුන් විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුමක් නම් කළ යුතු වේ.

31. හවුල් ගිණුම් හිමියෙකු මියගිය අවස්ථාවක, ජීවත් වන්නන් පිළිබඳ සිද්ධාන්තය අදාළ වනු ඇති අතර, වාරික ගෙවීමට නියමිත දිනයට මාසික වාරික ගෙවනු ලබන බවට ජීවත් ව සිටින ගිණුම් හිමියා/ හිමියන් වග බලා ගත යුතු වේ.

32. තනි පුද්ගල ඉතුරුම් සැලසුම් හිමියෙකුට අනෙක් පාර්ශ්වයෙන් හෝ පාර්ශ්වයෙන් හෝ පාර්ශ්වයන්ගෙන් කිසිදු වගකීමක් නොමැති බවට ලිපියක් ලබාදීමෙන් හවුල් ගිණුමක් හර ගිණුමක් ලෙස නම් කළ හැකිය.

33. SKSP හැර SSP (ශ්‍රී.ලං.රු./ඇ.ඩො) හි පවත්නා ශේෂයෙන් 75% දක්වා ණය පහසුකම් ලබාගත හැකිය.

34. මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකාවේ පවතින නීති රීති මගින් පාලනය වනු ඇත.

35. 2006 අංක 05 විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත මඟින් බැංකුව පාලනය වන බවත්, නියාමන නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය විසින් නියම කර ඇති පරිදි සීමාවට ඉහළින් සිදුවන ඕනෑම සැක සහිත ක්‍රියාකාරකම් සහ ගනුදෙනු පිළිබඳ

තොරතුරු වාර්තා කිරීමට සහ ඉදිරිපත් කිරීමට බැංකුව බැඳී සිටින බවත් අපි දනිමු.

36. ගිණුම්/මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඇති ඕනෑම ගැටළුවක්, ප්‍රතිපෝෂණයක් හෝ පැමිණිලි යොමු කිරීම සඳහා,

ජ්‍යෙෂ්ඨ කළමනාකාරු - පාරිභෝගික අත්දැකීම් කළමනාකරණ ඒකකය

සෙලාන් බැංකුව

04 වන මහල, සෙලාන් ටවර්ස්

අංක 90, ගාලු පාර

කොළඹ 03

දුරකථන: 0112456981, 0112456982 හෝ 24 x 7 ක්ෂණික ඇමතුම් අංකය 0112008888.

විද්‍යුත් තැපෑල: customer.experience@seylan.lk